# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2338/30 - 2023 ජුනි මස 28 වැනි බදාදා - 2023.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ සංශෝධන පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

පිඹුරු අංකය:- කැඩැස්තර සිතියම් අංක 410257

ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0379

පිහිටීම:- පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 593 පුලිච්චාකුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුලිච්චාකුලම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 410257 හි සවිස්තරව පෙන්නුම් කරන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0379 ක් පමණ වූ කීරියන්කල්ලි නැමැති පහත දැක්වෙන මායිම් සහිත ඉඩම

*උතුරට*: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය හා පුලිච්චාකුලම (කොටසක්); *නැගෙනහිරට*: පුලිච්චාකුලම (කොටසක්); *දකුණට* : පුලිච්චාකුලම (කොටසක්); *බටහිරට* : පුලිච්චාකුලම (කොටසක්) සහ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.07.10 වැනි දින පෙ.ව. 10.00ට මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2023.07.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එම්. එස්. බී. ඩබ්. ටී. එම්. එස්. බී. මල්විල,**
සහකාර ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් මුන්දලම *වෙනුවට.*

2023 ජුනි මස 21 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

EOG 06 - 0229